# සහභාගීත්ව සංවර්ධනය යනු කුමක් ද?

ජේ. එම්. හේනෙගෙදර,
අංශ ප්‍රධාන, වාරිජලපාලන හා ගොවිජන සම්බන්ධතා අංශය

මහජන සහභාගීත්වය ඇතිව සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම ඉතා වැදගත් සංවර්ධන ක්‍රමෝපායක් වශයෙන් ලොව බොහෝ රටවල් වර්තමානයේ දී පිළිගෙන ඇත. කෘෂිකර්මය මත පදනම් වූ ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ දී මහජන සහභාගීත්වය අත්‍යවශ්‍ය සාධකයක් බවට අන්තර් ජාතික සංවර්ධන ආයතන ද පිළිගෙන ඇති අතර, මේ නිසා පසුගිය දශක දෙක තුළ ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය වැඩසටහන් සැලසුම් කිරීම, ප්‍රමුඛතා තීරණය කිරීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ඒවා ඇගයීමේ දී මහජන සහභාගීත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය බව පෙන්නුම් කරන ලදි. මෙයට හේතුවක් වූයේ මහජන සහභාගීත්වයක් නොමැතිව මුල් කාල වලදී සිදු කරන ලද ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිලාභ සංවර්ධනයේ කොටස්කරුවන් වන ගැමි ජනතාවට නොලැබී යාම යි. සමස්තයක් වශයෙන් මුළු රටම සැළකිල්ලට ගෙන වෙළෙඳ පොල සාධක සකස් කරන හා ක්‍රියාත්මක කරන ජාතික මට්ටමේ සංවර්ධන වැඩපිළිවෙලවල් හා සැලසුම් වලින් රටේ ආර්ථික සංවර්ධනයක් ඇති කළ හැකි වුවත් සංවර්ධනයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස රටේ බහුතරය වන ගැමි ජනතාව වෙත නො ලැබී යන්නේ නම්. එම සංවර්ධන වැඩසටහන් වලින් ප්‍රතිඵලයක් නො වනු ඇත. මේ නිසා දියුණු වන රටවල ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ගැමි ජනතාවගේ සහභාගීත්වය සහතික කරන පහළ සිට ඉහළට ක්‍රියාත්මක කෙරෙන සැලසුම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් පවතී. ශ්‍රී ලංකාවේ ද කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේ දී මහජන සහභාගිත්වය අනුව එම කටයුතු සිදු කිරීමට 1980 දශකයෙන් පසු විශේෂ අවධානයක් යොමු කර ඇත. කෘෂිකර්ම හා ගොවිජන සේවා දෙපාර්තමේන්තු යටතේ ගොවි සංවිධාන ඇති කිරීම මහා වාරිමාර්ග පද්ධති යටතේ ගොවි සංවිධාන පිහිටුවීම, ග්‍රාම සංවර්ධන කමිටු හා ජනසවි කණ්ඩායම් ඇති කිරීම තුළින් රජය අපේක්ෂා කරනු ලැබුවේ සංවර්ධන කටයුතු වල දී වඩාත් ඵලදායී අන්දමින් මහජන සහභාගීත්වය ලබා ගැනීම යි.

සංවර්ධන ක්‍රියාවලියේ දී මහජන සහභාගීත්වය යන්නෙන් අදහස් කරනු ලබන්නේ සංවර්ධනයේ කොටස් කරුවන් වන ජනතාව එනම්, බාල මහළු, වැඩිහිටි, ගැහැණු, පිරිමි, වශයෙන් සමාජයේ සිටින සියළුම ජන කොටස් තම ප්‍රදේශයේ සිදු වන ආර්ථික හා සමාජ සංවර්ධන කටයුතු වල දී එහි ප්‍රමුඛතා හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීමට උදව් කිරීම, ප්‍රගති පාලනය හා ඇගයීම් කිරීම වැනි සියළුම කාර්යයන් වල දී ඉතා ඵලදායී අන්දමින් සහභාගී වීම යි. මෙසේ සහභාගී වීම තුළින් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සිදු විය හැකි සංනිවේදන පරතරය හෙවත් නිසි තොරතුරු නො ලැබී යාම මග හැරෙන අතර එසේම ඒ තුළින් නව අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට හැකියාවක් ලැබේ. මෙහිදී මහජන සහභාගීත්වය මගින් අපේක්ෂා කරන්නේ ජනතාව පොදු අරමුණක් කරා සංවිධානය කොට මනාව සම්පත් සංවර්ධනය සඳහා ක්‍රියාකාරී කරවීම යි. මහජන සහභාගිත්වය අවශ්‍ය වන්නේ ඇයි ද යන්න මෙහිදී නිතැතින්ම පැන නැගෙන ප්‍රශ්නය කි.

සහභාගීත්ව සංවර්ධනය ගැන කරුණු දක්වන අය එහි වැදගත්කම පහත සඳහන් කරුණු ඔස්සේ ඉදිරිපත් කරයි.

1. රටක ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය හා අනෙකුත් මහජන අවශ්‍යතා අනුව සංවර්ධන සැලසුම් සකස් කිරීමට දුෂ්කරතා ඇති වේ. සහභාගීත්ව සංවර්ධනය මගින් මෙය අඩු කළ හැක.

2. මහජනතාවගේ අවශ්‍යතා අනුව සිය හැකියාවන් දියුණු කර ගැනීමට හැකියාවක් මෙයින් ලැබේ.

3. ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයන් තුළ සහභාගී වී සාමූහිකව කටයුතු කිරීමෙන් ප්‍රජාතන්ත්‍රික අගයන් විනාශ වී යා හැක.

4. එකමුතු වී තීරණ ගැනීම භේද බින්න වී කටයුතු කිරීමට වඩා හොඳ යයි සැළකීම.

5. මහජනතාවට තමන්ගේ ප්‍රශ්න ඉදිරිපත්

කිරීමේ හා විසඳුම් ලබා ගැනීමේ ක්‍රමයක් වීම.

6. සමාජය තුළ විවිධ උප කණ්ඩායම් හා අනුකාරක කණ්ඩායම් බිහිවීම වැළැක්වීම.

7. හුදෙකලාව හා පෞද්ගලිකව ජීවත්වීමෙන් ඇති වන අයහපත් ප්‍රතිඵල නැති කිරීමට හැකි වීම.

8. ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ ආසියාතික රටවල අතීත සමාජ ක්‍රමය ගොඩ නැගී තිබුනේ සාමූහික වගකීම් මත ගොඩනැගුණු සමාජ සාරධර්ම මත ය. මේ නිසා සාමූහික තීරණ මගින් කටයුතු කිරීම වඩාත් ඵලදායී විය හැක.

මෙම කරුණු සැළකිල්ලට ගෙන ශ්‍රී ලංකාව වැනි රටක ග්‍රාමීය සංවර්ධන ක්‍රියාදමයේදී සහභාගීත්ව සංවර්ධන සංකල්ප සංවර්ධන ක්‍රමෝපායක් වශයෙන් ක්‍රියාවට නගන්නේ කෙසේ ද යන්න විමසිය යුත්ත කි. මහජන සහභාගිත්වය මූලික වශයෙන් තීරණය කරන්නේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්වල කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු අනුව යි. බොහෝ විට සංවර්ධන වැඩසටහනක කෙටි කාලීන අරමුණ වන්නේ, නිෂ්පාදන හා රැකියා තත්ත්වයන් ඉහළ නැංවීම යි. එහෙත් දිගු කාලීන පරමාර්ථ වශයෙන් සළකන්නේ කෙටි කාලීන පරමාර්ථ කොතරම් තිරසාර ලෙස ලබා ගත හැකි ද යන්නත්, ස්වශක්තිය අනුව ස්වයං තීරණ ගැනීමේ මට්ටම දක්වා ජනතාව දියුනු කිරීමත් විය හැක. මෙසේ කෙටි කාලීන හා දිගු කාලීන පරමාර්ථ මත ජනතාවගේ ජීවන තත්ත්වය සහභාගීත්ව ක්‍රමය තුලින් ඉහළ දැමීමට අපේක්ෂා කරන්නේ නම් මෙහි දී සැළකිය යුතු කරුණු කිහිපය කි.

1. මහජන සහභාගීත්වය සහතික කිරීම විවිධ අවශ්‍යතා හා අරමුණු මත ජීවත්වන සමාජයේ විවිධ ජන කොටස් එක අරමුණක් කරා ඒකරාශී කර වීම, ආදායම් මට්ටම, ඉඩම් ව්‍යාප්තිය හෝ පවතින ප්‍රශ්න වල බලපෑම අනුව සමාන කණ්ඩායම් තෝරා ගෙන ඒ අනුව කුඩා කණ්ඩායම් ඇති කිරීමෙන් ජනතාව සංවිධානය කළ හැකි ය.

2. මහජනතාව දැනුවත් කිරීම: කණ්ඩායම් කාර්යයන් හා කණ්ඩායම් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ජන කොටස් දැනුවත් කළ යුතු ය.

3. මහජනතාවගේ හැකියාවන් හා පවත්නා සම්පත් ගැන නිසි අවබෝධයක් ලබා ගත යුතු ය.

4. පරිසරයට හා ග්‍රාමීය සාර ධර්ම වලට හානි කර නො වන අන්දමින් සංවර්ධනයේ ක්‍රියාමාර්ග සඳහා ජනතාව දැනුවත් කිරීම.

5. ජනතාව හුදෙක් සංවර්ධනයේ ප්‍රතිලාභීන් නොව සංවර්ධනයේ හිමිකරුවන් බව ඔවුනට ඒත්තු ගැන්වීම.

සහභාගීත්ව සංවර්ධනය තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ රැස කි. ආර්ථික වශයෙන් සමහර ප්‍රතිලාභ මැනිය හැකි වුවත් බොහෝ විට සමාජ ප්‍රතිලාභ ප්‍රමාණාත්මකව මැනිය නොහැක. සහභාගිත්ත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වූ රටවල අත්දැකීම් සැළකිල්ලට ගැනීමේ දී මහජන සහභාගීත්වය තුළින් ජාතික ධනය ඉතා විශාල වශයෙන් ඉතිරි කර, ඇති බව පෙනේ. මහාමාර්ග සංවර්ධනය / මහා වාරිමාර්ග පද්ධති හා සුළු වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් හා නඩත්තු කිරීම, පාසැල් සංවර්ධන කටයුතු වැනි දේ මගින් කම්කරු ශ්‍රමය වශයෙන් ගෙවන ලද විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ඇත. දැනට වාරිමාර්ග කළමනාකරණ අයතනය මගින් රුපියල් ලක්ෂ ගණනක මුදල් වැය කොට කරනු ලබන වාරිමාර්ග පද්ධතිවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු සහභාගීත්ව කණ්ඩායම් වලට පැවරීමෙන් ඉතිරි කර ඇත.

මොණරාගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය මගින් සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග හා කුඩා වාරිමාර්ග පද්ධති සකස් කිරීමේ දී අවශ්‍ය උපදෙස් හා සැලසුම් සකස් කරනු ලැබ ඇත්තේ ග්‍රාමීය මට්ටමේ කුඩා කණ්ඩායම්වල සහභාගීත්වයෙනි. මේ මගින් ජනතාවට අවශ්‍ය පරිදි එම සංවර්ධන කටයුතු කරවා ගැනීමට ජනතාවට හැකිවිනි.

මහජන සහභාගීත්වය ඇති ව කටයුතු කරන විට එම සංවර්ධන වැඩපිළිවෙලවල් ගැන ජනතාවගේ වගකීමක් හා ආරක්ෂාවක් නිතැතින්ම ඇති වේ. උදහරණයක් වශයෙන් ජනතාව විසින් ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග පද්ධති සතුන්ගෙන් හා අනෙකුත් හානි පමුනුවන්නන්ගෙන් අරක්ෂා කර ගන්නේ ද ජනතාවම යි. මේ තුළින් පද්ධතිවල නඩත්තුව හා ආරක්ෂාව ඔවුන්ගේ ම කාර්යයක් ලෙස ජනතාව තුළ හැඟීමක් ඇති වීම ඉතා වැදගත් දෙයකි.

අමුද්‍රව්‍ය ලබා ගැනීම, අලෙවි ප්‍රශ්න හා වගාවන් සම්බන්ධ ගැටළු ඇතිවිට ඒවා සාකච්ඡා කොට කණ්ඩායම් මාර්ගයෙන් විසඳා ගැනීමත්, කණ්ඩායම් ණය ක්‍රමය තුළින් වගා ණය ප්‍රශ්නය විසඳා ගැනීමත්, වගා වැඩසටහන් හා සැලසුම් මගින් බෝග හා ජලය නිසි පරිදි භාවිතා කිරීමට පියවර ගැනීමත්, ගොවීන් සංවිධානය වීම තුළින් ලැබූ ප්‍රතිලාභ වේ. ග්‍රාමීය ණය බරින් මිදීම, වෙළඳපොල ප්‍රශ්න හා නිසි කලට වගා කිරීම තුලින් වගා හානි අවම කිරීම වැනි ප්‍රතිලාභ ගොවීන්ට ලබා ගත හැක්කේ හුදෙක් කණ්ඩායම් වශයෙන් සංවිධානය වීමෙන් පමණි.

සහභාගීත්ව සංවර්ධනයේ විශේෂ වාසියක් නම් නිලධාරීන් හා ජනතාව අතර, පවතින පරතරය අඩු කිරීමට හැකිවීම යි. ජනතාව සංවිධානය වන විට නිලධාරීන්ගේ සේවාව ලබා දීම පහසු ය. එසේ ම නිලධාරීන් අකාර්යක්ෂම නම් ඔවුන් කාර්යක්ෂම කරවීමට ජනතාවට හැකි ය. බැංකු ණය, කෘෂි රක්ෂණ හා ව්‍යාප්ති සේවාවන් ඉතා ඵලදායී ලෙස ලබා දිය හැක්කේ, ගොවීන් සම්බන්ධ වී සිටියහොත් පමණි. මෙය සිදු කළ හැක්කේ ගොවීන් හා නිලධාරීන් අතර නිරන්තරයෙන් සිදු වන අදහස් හුවමාරුවෙනි.

මීට අමතරව කණ්ඩායම් ඉතිරිකිරීමේ ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ග්‍රාමීය සමාජවල පවත්නා මූල්‍ය දුර්වලතාවයන් නැති කළ හැකි අතර, ඵලදායී කුඩා පරිමාණ ව්‍යාපාරවලට එම මුදල් ආයෝජනය කිරීම වද හැකි ය. මෙම කරුනු සැළකිල්ලට ගැනීමේ දී සහභාගිත්ව සංවර්ධනය තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ ඉතා විශාල බව පෙනේ.

සහභාගිත්ත්ව සංවර්ධනය තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ ඉතා විශාල වුවත්, සංවර්ධන ක්‍රමෝපායයන් වශයෙන් ජනතා සහභාගිත්වය ලබා ගැනීම හා තිරසාර ලෙස එය පවත්වාගෙන යෑම ප්‍රශ්ණයක් වී ඇත. මෙසේ වන්නේ කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීමේ දී කණ්ඩායමේ සාමාජිකයන් තුළ නිතැතින්ම ඇති විය යුතු කණ්ඩායම් හැඟීම හා වගකීම නොමැති කමත්, සමාජයේ පවත්නා ආර්ථික සාමාජික හා ආගමික විෂමතා නිසාත් ය. සහභාගීත්ව සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන වශයෙන් බලපාන බාධක කිහිපය කි.

1. ග්‍රාමීය සමාජයේ මුල් බැස ගෙන තිබෙන විෂම අදහස් හා හුදෙකලා ව පෞද්ගලික මට්ටමෙන් කටයුතු කර ගෙන යාමට උත්සාහ දරණ කණ්ඩායම් සිටීම.

2. දේශපාලනික හේතු මත ගොවීන් බෙදී සිටීම. සමහර විට අසාර්ථක වූ අත්දැකීම් ඇති ග්‍රාමීය මට්ටමේ සංවිධාන නිසා ද මෙම තත්ත්වය ඇති විය හැක.

3. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග නිසි සම්බන්ධීකරණයක් නොමැතිකම.

4. අනවබෝධය හා උනන්දුව මඳවීම නිසා කන්ඩායම් කටයුතු වලට සහභාගි නො වීම.

5. ආර්ථික වාසි බලාපොරොත්තුවෙන් පමණක් පොදු සංවර්ධන කටයුතුවලට සහභාගී වන අය සිටීම.

6. ධනය, කුලය හා වාර්ගික පදනම මත අනු කණ්ඩායම් බිහි වීම.

7. මහජන සහභාගීත්වය මගින් ගනු ලබන සමහර තීරණවලට නීතිමය බලයක් නැතිකම.

8. ප්‍රදේශයේ දේශපාලන බලවතුන්ගේ අනවශ්‍ය සොයා බැලීම හා බලපෑම්

මෙම තත්ත්වයන් සැළකිල්ලට ගත් කළ සහභාගිත්ත්ව සංවර්ධන සංකල්පය ක්‍රියාවට නැංවීමට නම් ඒ පිළිබඳව පැහැදිළි අවබෝධයක් ප්‍රතිපත්ති සකස් කරන්නන්ට, එය ක්‍රියාත්මක කරන්නන්ට, මෙන්ම එහි ප්‍රතිලාභින්ට ද තිබිය යුතු ය. මේ නිසා සහභාගිත්වය සංවර්ධනය යටතේ ජනතාව පමණක් සංවිධානය කිරීමෙන් ඇති ඵලයක් නො වේ. නිලධාරීන් ද දැනුවත් කළ යුතු ය. එසේම සංවිධානය විය යුතු ය. කණ්ඩායම් හැඟීම් ජනතා අවබෝධයක් දෙන විට කණ්ඩායම් තීරණවල වැදගත්කම ගැන නිලධාරීන්ට ද පැහැදිළි කළ යුතු ය. මෙසේ කළහොත් අපේක්ෂිත ප්‍රතිඵල සහභාගීත්ව සංවර්ධණ ක්‍රියාමාර්ගයන්ගෙන් ලබා ගත හැක. මෙහි දී විශේෂයෙන් ම කළ යුතු වන්නේ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන්ට මෙන්ම ජනතාවටද පැවරී ඇති වගකීම් හා කාර්යයන් පිළිබඳව අන්‍යෝන්‍ය අවබෝධයක් ලබාදීම යි. එසේ නොමැති නම් එය හුදෙක් සංකල්පනාවකට පමණක් සීමා වනු ඇත. කණ්ඩායම් අවශ්‍යතා නිසි පරිදි තේරුම් නො ගැනීමත් සමාන මට්ටමේ ජන කොටස් එක් නොකොට ඔවුනට සංවිධානය වීමට සැලැස්වීමත් නිසා සහභාගීත්ව සංවර්ධන සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ නිසි පරිදි ලබා නො ගන්නා තත්ත්වයක් පෙන්නුම් කෙරේ.